**ශීර්ෂ 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ජේදයේ සිට 2 ජේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ජේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) ගාල්ල කඩවත්සතර
(ආ) තවලම
(ඇ) නියාගම
(ඈ) අම්බලන්ගොඩ
(ඉ) කරන්දෙනිය
(ඊ) ඇල්පිටිය
(උ) නෙළුව
(ඌ) නාගොඩ
(එ) බලපිටිය
(ඒ) හික්කඩුව
(ඔ) අක්මීමන
(ඕ) බෙන්තොට
(ක) හබරාදුව
(ග) බද්දේගම
(ච) යක්කලමුල්ල
(ජ) බෝපේ පෝද්දල
(ට) වැලිවිටිය - දිවිතුර
(ඩ) ඉමදුව
(න) ගෝනපීනුවල

## 1.1 විගණන විෂය පථය

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම්

හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 936 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 930 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු. මිලියන 6 ක් හෙවත් සියයට 0.64 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 890 | 884 | 6 | 0.64 |
| මුලධන | 46 | 46 | 0 | - |
| **එකතුව** | **936** | **930** | **6** | **0.64** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 5,954 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු.මිලියන 4,926 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.මිලියන 1,028 ක් විය.

### 2.2 අත්තිකාරම් ගිණුම

---------------------

#### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 26101 | 52 | 52 | 47 | 48 | 235 | 202 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0308/0013/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.194,086 ක් වී තිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0037/0000/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු. මිලියන 445 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3 ශීර්ෂ 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**3.1 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂනය විය.

**(අ) මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති**

2011 මැයි 20 දිනැති අංක MED/RD/PR/01 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාම සංවර්ධන) ගේ ලිපියට අනුව ගාල්ල දිස්ත්‍රික්කය තුළ කිලෝ මීටර් 310 ක් දිග මාර්ග 102 ක් කාපට් කිරීම සඳහා 2011 මැයි 11 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි. එම අනුමැතිය යටතේ මාර්ග සංවර්ධනය කිරීමේ වගකීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතද, ඉදිකිරීම් කටයුතුවල අධීක්ෂණය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතද පවරා තිබුණි. 2011 ජූනි 20 දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් කිලෝ මීටර් 310 ක මාර්ග කාපට් කිරීම සඳහා රු.3,100,000,000 ක වටිනාකමකට මාස 6 කින් වැඩ අවසන් කිරීමට යටත්ව ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර වර්ෂ 03 ක් ගතවී තිබුණත්, 2014 අගෝස්තු 30 දින වනවිට ප්‍රගති වාර්තාවට අනුව කිලෝ මීටර් 297.78 ක ප්‍රමාණයක පමණක් වැඩ අවසන් කර තිබුණි.

(ii) 2011 වර්ෂයේදී අවස්ථා තුනකදී එකතුව රු.694,400,000 ( එකතු කළ අගය මත බදු සමඟ) ක්ද, 2013 වර්ෂයේදී රු.117,028,786 ක්ද වශයෙන් එකතුව රු.811,428,786 ක අත්තිකාරම් ගෙවා තිබුණි. 2014 අගෝස්තු 30 දින වන විට එම අත්තිකාරම්වලින් රු.485,280,069 ක් හෙවත් දෙන ලද අත්තිකාරම්වලින් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් පමණක් පියවා තිබුණි.

**(ආ) සරණ හන්දිය, අළුත්වල හන්දිය, කිරිඳි ඇල මීටියාගොඩ ගලගොඩ හන්දිය දක්වා මාර්ගය කිලෝ මීටර් 10.5 ක් කාපට් කිරීම**

යථෝක්ත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.195,869,435 ක් මත කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. 2011 ජූනි 20 දින වන විට රු.17,248,000 ක් ගෙවා තිබුණත් 2014 ඔක්තෝබර් 14 දින වනවිට කොන්ත්‍රාත්තුවේ කටයුතු නිමකර දිස්ත්‍රික් ලේකම් වෙත භාරදී නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණන අවස්ථාව වන විට මාර්ගය ආරම්භක කිලෝ මීටර් 2.8 ක කොටස ABC ඇතිරීමට හෝ කාපට් යෙදීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මාර්ගය ඉතා අබලන් තත්ත්වයට පත්වී තිබුණි.

(ii) මෙම මාර්ගයේ ඉදිකිරීම සිදුකර කාපට් අතුරන ලද කිලෝ මීටර් 7 ක් තුළ උරහිස් තලයේ සිට මිලි මීටර් 300 ක් දක්වා ප්‍රමාණයන් 5 කින් පැවති අවස්ථා නිරීක්ෂණය වූ අතර මාර්ගතලය මට්ටම දක්වා නිමවා නොතිබූ ස්ථානද නිරීක්ෂණය විය.

(iii) ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් කාණු යෙදිය යුතු ප්‍රමාණය කිලෝ මීටර් 1.820 ක් ලෙස හඳුනාගෙන තිබුණද, එලෙස කාණු නොයෙදීම හේතුවෙන් ABC තට්ටුව ගැලවී කාපට් තට්ටුව කැඩී යාමේ තර්ජනයට පත්වී තිබුණි.

(iv) ඉදිකරන ලද කිලෝ මීටර් 7 ක මාර්ගය හරහා බෝක්කු ඉදි කළ යුතු ස්ථානවල බෝක්කු ඉදි නොකිරීම හේතුවෙන් මාර්ගය දෙපස ස්ථාන කිහිපයක ජලය රැඳී පැවතුණි.

**(ඇ) ගෝනපීනුවල මහවෙල්ල ලේල්කඩ දක්වා කිලෝ මීටර් 3.5 ක කාපට් ඇතිරීම**

ඉහත ව්‍යාපෘතිය සඳහා රු.70,812,750 ක අනුමත ඇස්තමේන්තුවක් යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ 2011 ජුනි 20 දින ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුමට අනුව කර්මාන්තය මාස 06 කින් නිමකළ යුතුව තිබුණි. 2014 අගෝස්තු 30 දින වන විට රු.33,430,133 ක් ගෙවා තිබුණු අතර, 2014 ඔක්තෝබර් 09 දින වන විටත් මාර්ගයේ වැඩ අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම මාර්ගයට කාපට් ඇතිරීමෙන් පසු උරහිස් මාර්ග තලයේ මට්ටමට පස් පුරවා සනවත් කිරීම සම්පූර්ණ කර නොතිබුණු අතර මාර්ග තලය හා උරහිස අතර ගැට්ට මිලි මීටර් 100 කටත් වඩා වැඩි ප්‍රමාණයන්ගෙන් යුතු ස්ථාන පැවැතුණි.

(ii) උරහිස් පිරවීමට යොදාගෙන තිබූ පස්වලට ජලය උරාගැනීම හේතුවෙන් දියාරු බවට පත්ව මඩ වලවල් සෑදී තිබූ අතර උරහිස් නිසි ප්‍රමිතින්ට අනුව සුදුසු බොරළු පස් යොදා සනවත් නොකිරීම හේතුවෙන් මීටර් 480,1360,2000 සහ 2600 යන ස්ථාන වල කාපට් තට්ටු කැඩී තිබුණි.

(iii) මීටර් 1490 ක් පමණ වූ ස්ථානයේ පැවති පරණ බෝක්කුව මත දමන ලද කාපට් තට්ටුව (මාර්ගය මැද) පුපුරා තිබුණු අතර පැරණි බොක්කුව අස්ථාවරවීමෙන් එම තත්ත්වය සිදුවී තිබුණි.

**(ඈ) පිටිවැල්ල රණපනාදෙනිය මාර්ගය කිලෝ මීටර් 6.5 ක් කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය**

යථෝක්ත ව්‍යාපෘතිය සඳහා රු.145,435,380 ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2011 ජූලි 28 දින දිස්ත්‍රික් ලේකම් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ගිවිසුමකට එළඹ තිබුණි. 2014 ඔක්තෝබර් 10 දින වන විට මේ සඳහා රු.73,281,600 ක් ගෙවා තිබුණි. 2012 ජනවාරි 28 දින වන විට කර්මාන්තයේ වැඩ නිමකළ යුතුව තිබුණත් 2014 ඔක්තෝබර් 10 දින වන විටත් එහි වැඩ නිම කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 07 දින විගණන අවස්ථාව වන විටත් මාර්ගයේ ආරම්භක මීටර් 110 ක් වු කොටස කාපට් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2014 අගෝස්තු 30 දිනට ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තාව අනුව භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා තිබුණත් මාර්ගයේ ස්ථාන 08 ( මීටර් 2 සිට 110 දක්වා වු) ක් කාපට් අතුරා නොතිබුණි. (Base Court වලට අදාල ස්ථාන හා Culverts ඉදිකළයුතු ස්ථාන ඇතුළුව)

(iii) කාපට් අතුරා නොතිබු ඉහත සඳහන් ස්ථාන වල ABC තට්ටුවද ගැලවී විශාල වලවල් සෑදී තිබුණි.

(iv) මාර්ගය දෙපස උරහිස් මීටර් 150 සිට මීටර් 225 දක්වා වු ප්‍රමාණයන්ගෙන් මාර්ග තලයට වඩා පහතින් පැවති අවස්ථා විශාල ප්‍රමාණයෙන් නිරීක්ෂණය වු අතර උරහිස් පුරවන ලද ස්ථානවලද විශාල ලෙස වලවල් සෑදී තිබුණි. දෙපස පිරවීම සඳහා අනුමත පස් යොදාගෙන නොතිබුණි.

(v) මාර්ගයේ කිලෝ මීටර් 4ක් පමණ අවසන් වන ස්ථානයේ බෝක්කුවක් දැමීමට සැළසුම් කිරීම නිසා එහි කාපට් අතුරා නොතිබුණ නමුත් විගණිත අවස්ථාව වන විටත් බෝක්කුව ඉදිකර නොතිබුණි.

(vi) මාර්ගයේ මීටර් 3,955 ක් පමණ අවසන් වන ස්ථානයේ පැවති Hume pipe culverts ඉවත් කිරීමට කටයුතු නොකිරීම හා ඊට ඉදිරියෙන් සැලැසුම් කළ පරිදි culvert එකක් ඉදි නොකිරීම හේතුවෙන් මාර්ගයේ ජලය බැස යාම අවහිර වී තිබුණි.

(vii) මාර්ගය සකස් කිරීමේදී කොන්ක්‍රීට් කාණු දැමීය යුතු ස්ථාන වූ මීටර් 1400 සිට 1600, මීටර් 2300 සිට 2400, මීටර් 2800 සහ මීටර් 3300 කොන්ක්‍රීට් කාණු නොයෙදිම නිසා මාර්ගයට යොදන ලද ABC තට්ටුව ගැලවෙමින් පැවැතුණි.

(viii) Dish Drain යෙදීය යුතු ස්ථාන මීටර් 400 ක් හඳුනා ගෙන තිබුණද එම ස්ථාන සඳහා Dish Drain නොයෙදීම හේතුවෙන් උරහිස් තලය ඉතා විශාල වශයෙන් සේදී තිබුණි.

## 3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 26101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු වර්ෂ එකකට වැඩි ශේෂවල එකතුව රු.1,631,547 ක් වී තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පරිපාලන නිලධාරි නිල නිවස වසර 5කට වැඩි කාලයක සිට බාහිර පාර්ශවයක් විසින් පරිහරණය කරනු ලබන අතර මේ සඳහා නිවාස කුලීයක්ද අයකර නොතිබුණි.

**3.4 අනුකුල නොවීම්**

**------------------**

**නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

ගිනි අවි ආඥා පනතේ 23(3) වගන්තියට අනුව ගිනිඅවි බලපත්‍ර අවුරුදු පතා අළුත් කරගත යුතු වුවද, බලපත්‍ර වටිනාකම රු.12,700 ක්වු ගිනිඅවි 29 ක බලපත්‍ර අළුත් නොකර සන්තකයේ තබාගෙන තිබුණි.

**3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්**

**------------------------------------------**

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද දුරස්ථ අධ්‍යාපනික ව්‍යාපෘතිය සඳහා 2014 දෙසැම්බර් 31 දින වනවිට රු.1,400,000 ක් වියදම් කර තිබුණද, එම වියදමට ඇතුළත් වු බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය ලැබීමේ ප්‍රමාදය මත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**---------------------------------------**

**අක්‍රීය බැංකු ගිණුම්**

**--------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලැබූ බැංකු ජංගම ගිණුම 2006 වර්ෂයේ සිට අක්‍රීයව පැවති අතර එහි ශේෂය රු.194,086 ක් වී තිබුණි.

**3.7 පාඩු හා හානි**

**---------------**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකට අදාල වාහන 3 ක් අනතුරට ලක්වී වර්ෂ 3 ක සිට වර්ෂ 13 ක් දක්වා කාලයක් ගතවී තිබුණද, අදාළ අලාභය වු රු.184, 851 ක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 68 | 64 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 39 | 22 | 17 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,622 | 1,571 | 51 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 175 | 173 | 03 | 01 |
| **එකතුව** | | **1,904** | **1,830** | **75** | **01** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු 02 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරප්පාඩු 73 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාථමික මට්ටමට අයත් සේවකයකු අතිරික්තව සිටියත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.